S.டேனியல் சம்பத் குமார்
எண் 147, திருநிலை காலனி,
விச்சூர் போஸ்ட்,
சென்னை – 600 103




*for books contact :*

**S.DANIEL SAMPATH KUMAR**
*No. 147, Thirunilai colony ,*
*vichoor post , chennai - 600 103*
*E-Mail : sdanielsampathkumar@gmail.com*
*Website : danielendtimebooksministry.org*
*Phone No :* 99419 74213 , 96001 71260

SINGALAM

# The Spoken Word

by

WILLIAM MARRION BRANHAM

**සුභාරංචිය යනු කුමක් ද?**

**ஏழாம் தூதன்**

**வில்லியம் மரியன் பிரன்ஹாம்**

**"உரைக்கப்பட்ட வார்த்தையே மூல வித்து"**

111. දේව වචනය කවදාවත්ම සොයපු නැති ආකාරයෙන් සොයා බලන්න. අපි සියලු දෙනා ඊළඟ ලෝකයට ගමන් කරද්දී බාධාවක් නොතිබිය යුතුයි. ගමන් බල පත්‍ර අපේ අතේ තිබෙන්නට ඕනෑ. යම් බාධාවක් ඇත්නම් දැන්මම ඉවත් කරමු. පාරම්පරික ඉගැන්වීමයි අපිට බාධාවක් ව තිබේ. බයිබලයේ ඉගැන්වීම් වචනය මත අපේ ඇදහිල්ල තැබුවහොත් සියළුම බාධාවන් ඉවත් වී යයි. ශු. බයිබලයට ඇතුල්වන්න.

112. මනුෂ්‍යය ශබ්දවලට නොරැවටෙන්න. අපේ යහපත් එඬේරා වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ හඬට බයිබලයට කීකරු වෙමින් දේව රාජ්‍යයට ඇතුල්වන්න.

113. නුඹලා මිලයට ගන්නා ලද්දනුය. මනුෂ්‍යයන්ගේ වහලුන් නොවන්න. (1 කොරි 7:23)

## සුභාරංචිය යනු කුමක් ද?

01. යහපත් ආරංචිය තවත් නමකි සුභාරංචිය. ශුද්ධ වූ බයිබලයේ දේව රාජ්‍ය හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය යනුවෙන් සඳහන් වේ. මුළු සෙනගට මහත් ප්‍රිති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි කියමින් දේව දූතයන් කිවෝය. පළමුවෙන් දෙවියන් වහන්සේගේ රාජ්‍ය යනු කුමක්දැයි බලමු.

## දේව රාජ්‍යයේ සුභාරංචිය.

02. මෙම සුභාරංචිය ලෝකයට දේශනා කලේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන් වහන්සේ, කාලය සම්පූර්ණ විය. දෙවියන් වහන්සේගේ රාජ්‍ය සමීපය පසුතැවිලි වී සුභාරංචිය අදහා ගනිල්ලා යයි කී සේක. මාර්ක් 1:15. තවද ඔහු මනුෂ්‍යයන්ගේ රාජ්‍ය අවසන් වී දෙවියන් වහන්සේගේ රාජ්‍ය ලොවට පැමිණෙන කාලය ළංව තිබෙන බැවින් අපි පසුතැවිලි වී සුභාරංචිය අදහා ගැනීම අවශ්‍යය බව ප්‍රකාශ කළා. නමුත් දේවරාජ්‍යය පැමිණීමේ දී අපට මෙයින් ලැබෙන යහපත්දේ කුමක්ද?

03. මනුෂ්‍යයන්ගේ පාලනයේදි අපි භුක්ති විඳින්නේ කුමක්ද? කුසගින්න, නිරිවස්ත්‍ර, ලෙඩ රෝග, දුක්, කඳුළු. රැවටීම්, මරණය මේ වැනි දේවල්ය. නමුත් මේ ලෝකය දෙවියන් වහයන්සේ පාලනය කරාවි නම් උන් වහන්සේගේ රාජ්‍යයෙහි මේ වැනි උපද්‍රව්‍ය තිබෙන්නේ නැත. ලෝකයේ තිබෙන්නාවූ දුක, කලකිරීම්වලින් මිදී අපේ පාපවලින් නිදහස් වී උන් වහන්සේගේ රාජ්‍යයේ සතුටින් සිටිය හැක. එසේ ලෙඩ රෝග හා මරණ නොමැති බැවින් රෝහල් හා සුසාන භූමියද නැත. අපව ප්‍රිතියෙන් හා සතුටින් තබමින් මරණ නොමැති ජීවිතයක් ලබා දිමයි මේ සුභාරංචියේ අරමුණ. නමුත් පැමිණෙන්නට තිබෙන්නා වූ ඒ රාජ්‍යයේ සිටින්නේ කවුර, කවුරුද?

04. එම රාජ්‍යය අපි සියලු දෙනාටම සිටින්නට පුළුවන්. මෙයයි එම සුභාරංචිය! යමෙක් කවුරුහෝ වේවා, කුමන ජාතියක් හෝ කුමන භාෂා කථා කරන්නෙක් හෝ වේවා උගත් හෝ නුගත් වේවා දුප්පත් හෝ පොහොසත් වේවා දුප්පතුන් සහ පොහොසතුන් එකට එම රාජ්‍යයට ඇතුල් විය හැක. මෙය උසස් ජීවතය ලබා දි ප්‍රිති උපදවන සුභාරංචිය නොවේ ද? නමුත් රාජ්‍යයේ ඇතුල් වන්නේ කෙසේද ? යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වචනයේ ආකාරයෙන් පළමුවෙන් අපි පසුතැවිලි විය යුතුයි.

05. පසුතැවිලි වන්නේ කොහොමද ?

06. දෙවියන් වහන්සේගෙ රාජ්‍යයට ඇතුල් වීමට කැමති කෙනා තමන්ගේ සිත පාපිෂ්ඨ දේවල්වලින් හැරී එය අත්හැරිය යුතුයි. ද්‍රෝහිකම් නොකළ යුතුයි. තමා හැදුණු වැඩුණු පාරම් පරික පුරුදුවලින් හැරිය යුතුයි. හූනියම් නොකළ යුතුයි. සාස්ත්‍ර නොබැලිය යුතුයි. මැව්ල්ලට නමස්කාර නොකළ යුතුයි. අශුද්ධ ආත්මවලට හා මනුෂ්‍යයාව දෙවිවරුන් යැයි සිතමින් නමස්කාර නොකළ යුතුයි. සියලුම මහිමය ගෞරවය, ස්තුතිය සියල්ල මැවුවාවූ තැනන් වහන්සේට පමණක් දිය යුතුයි. තමාගේ සිත මුළුමණින්ම ලෞකික දේවලින් ඈත්ව, දෙවියන් වහන්සේ වෙතට යොමු කළ යුතුයි. මේවැනි පසුතැවිලි වීමයි ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළේ. මෙවැනි පසුතැවිලි නොවන්නාවූ අය ස්වරග රාජයයේ කොටස් කරුවෙක් නොවන්නේය.

07. පසුතැවිලි වුණායින් පසුව දෙවියන් වහන්සේගේ රාජ්‍ය ලෝකයට පැමිණෙන බව මුළු සිතින් විශ්වාස කළ යුතුයි.

08. එම නිසා දෙවියන් වහන්සේගේ රාජ්‍යය පැමිණෙන කල එම රාජයට ඇතුල් වන්නේ කෙසේද? දේව රාජ්‍යට ඇතුල් වන්නට කොන්දේසි දෙකක් තිබෙනවා. එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේම පවසා ඇත. යමෙක් වතුරෙන්ද ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වෙන්න නොහැකිය. යෝහන් 3:5. නමුත් වතුරෙන්ද, ආත්මයානන් ද ඉපදෙන්නේ කෙසේද එය දැනගන්නට නම්, අපි යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය දැන ගත යුතුය.

## යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය

09. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කවුරුන්ද ? උන් වහන්සේගේ සුභාරංචිය කුමක්ද ? යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. පුරුෂයෙකුගේ සම්බන්ධතාවයක් නොමැතිව ස්ත්‍රීයකුගෙහි උපන්නේය. දෙවියන් වහන්සේ ලෝකයේ තිබෙන්නා වූ පාපය නැති කර, නොමැරෙන ආත්මය මනුෂ්‍යාට ලබා දෙන පිණිස උන් වහන්සේව පූජාවක් වන පිණිස ලෝකයට එවූ සේක. උන් වහන්සේ මේ ලෝකයේ ඉපදීමට පෙර, උන් වහන්සේ මනුෂ්‍යාගේ පාපය උදෙසා බැටළු පැටියෙක් මෙන් පූජා කරනු ලබන බව ප්‍රකාශ කරන පිණිස දූතයෙක් දෙවියන් විසින් යවනු ලැබුවාය. ඔහුගේ නම යොහන් බව්තීස්ත

ඔහු යේසුස් ක්‍රිස්තුස් වහන්සේවෙ දැක කථා කොට අනන ලෝකයේ පාපය දුරු කරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියාණෝ යයි කියමින් සිටියාය.



105. ඔබ දේව රාජ්‍ය උදෙසා පෙර තෝරාගත් (එපිස 1:4 - 5) බීජය, දෙවියන් වහන්සේගේ ආලේපයට විරුද්ධ නොවන්නේය. මේ ලෝකයට තවත් කාලය නොමැත. පසුතැවිලි වන්න පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා ගන්න. ආත්මයාණන්ගේ බව්තිස්ම ලබා ගන්න. යේසුස් වහන්සේ උන්වහන්සේ ඉක්මනින් එන සේක. ඔබගේ ඇස් උන්වහන්සේව දකියි.

## බව්තිස්මයේ - යතුරු සාරාංශය

106. යේසුස්වහන්සේ ස්වකීය රාජ්‍ය යතුරු පේත්‍රුස් වෙතට දෙමින් (මතෙව් 16:19) සෙනහව රාජයට කැඳවන බලය සියලු ගොලයින්ට දුන්නේය. (මතෙව් 28:19) පෙන්තකොස්ත දවසේ පේත්‍රුස් ස්වර්ග රාජ්‍ය දොර විවර කළා. (ක්‍රියා 2:38-41)

107. වතුරෙනුත් ආත්මයාණන්ගෙන් ඉපදුනා වූ අය පමණයි දේව රාජ්‍ය දකින්නෙත්, ඇතුල් වන්නේත් යයි පැවසුවේ යේසුස් වහන්සේ (යොහන් 3:35) වතුරෙන් ලබා දෙන්නා වූ බව්තිස්මය ස්වාමිවූ ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් පමණයි දිය යුත්තේ. බව්තිස්ම ලබා ගන්නා පිණිස එන අයට තැන්පත් කරන ආකාරයෙන් මුහුණ උඩ අතට තිබෙන ආකාරයෙන් එක වතාවක් පමණයි ගිල්වන්නේ පසුව ශු. ආත්මයාණන්ගෙන් බව්තිස්ම ලබා ගන්න ඕනෑ.

108. යේසුස්වහන්සේ එක් එක් සභාවල්වලට එක් බව්තිස්ම ඉගැන්නුවේ නොමැත. ප්‍රෙරිතයන් ලබා දුන්නා වූ බව්තිස්මය සැබෑ වූ බව්තිස්මය, මේවාට තර්ක කරනවා නම් ඒ යක්ෂයාගෙන්ය.

109. දේව රාජ්‍ය ළංව තිබේ. ඔබගේ සදා කාල ජීවනය වැරදි ඉගැන්වීම මතත්, පාරම්පරික මුහුම්වලටත් සභාවේ ඉගැන්වීම් මතත් අත්තිවාරම් නොදමන්න ඔබ පසුතැවිලි වී පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා ගන්න. එවිට ශු. ආත්මයාණන්ගේ දීමනා ලැබෙන්නේය. (ක්‍රියා 2:38)

110. මෙය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආඥාව හා බලය සහ පොරොන්දු ද වේ. මෙයද සියලු කාලවලටත් සියළුම ඇදහිලිවතුන්ටත් සභාවල්වටත් දෙවියන් වහන්සේ ලබා දුන්නා වූ පොරොන්දුව යි.

(ක්‍රියා 8:12, 17) කොර්නේලිස්ගේ නිවසේ අය අදහාත් කල ආත්මයාණන් ලැබූ සේක. (ක්‍රියා 10:1. 17)

100. බොහෝ වචන වලින් යාච්ඤා නොකළ යුතුය. යේසුස් වහන්සේ පැවසූ සේක. (මතෙව් 6:7) නමුත් උන්වහන්සේට තුති කරන්න, ප්‍රසංසා කරන්න, මහිමයට පත්කරන්න එපා කීවේ නැත. (එළි 4:10) පළමු වතාවට ආත්මයාණන්ව ලබාපු අය දෙස බලන්න (ක්‍රියා 2:13 - 15)

101. ශු. ආත්මයාණන්ව ලබාපු බොහෝ අය නොයෙකුත් භාෂාවන් කථා කරන බව (ක්‍රියා 1:4) නොයෙකුත් භාෂා (ක්‍රියා 10:45) (ක්‍රියා 19:6) ඒ ආත්මයාණන් වහන්සේ අද දවසේ එක ආකාරයෙන්ම කියා කරනවා. මේ ගැන ඔබ විනිශ්චය දවසේදී උන්වහන්සේ ඔබ ගැන ලැජ්ජා වෙනවා නොවෙයිද?. (මාර්ක් 8:38) උන්වහන්සේ ඔබ ගැන ලැජ්ජා වෙනවා නොවෙයිද ? (මාර්ක් 8:38)

102. නුඹලා පසුතැවිලිව පව් කමාව පිණිස ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබමින් ශු. ආත්මයාණන්ගේ කොන්දේසිවලට කීකරු වෙනවා නම් ඔබටත් බව්තිස්ම ලබා ගන්න පුළුවන්. ශු. ආත්මයාණන් ඔබ මත පැමිණි කල කුරුල්ලන් වාගේ ශබ්ද කිරීම. (යෙසායා 38:14) (යෙසායා 28:11) (අනෙකුත් 3:16 ගිතාවලිය 47:1) ගායනා කිරීම (ගීතා. 66:1) දාතම (රෝම 8:23) නමුත් මෙය ඔබට විහිළුවක් නම් ඔබගේ අතරේ ස්වර්ග රාජ්‍ය තිබෙන බව ඔබ නොදනියි. යොහන් 3:4 රාජ්‍යයට ඇතුල් නොවන්නේය යොහන් 3-9, 9-12

103. සමහරු ශු ආත්මයාණන් වෙනුවට අශුද්ධ ආත්මය ලැබුවහොත් කුමක් කරන්නේ යයි. කියනවා නම් ශු. ආත්මයාණන්ව නොලබා නැවත ඉපදුනා කියලා කියන්නා වූ සහෝදර සභාවේ සිටින්නන් අසන ප්‍රශ්න මෙයයි. ඔබ ගේ ළමයෙක් මාළුවෙක් ඉල්ලුවොත් සර්පයෙක්ව දෙනවාද?. රොටි ඉල්ලුවොත් ගලක් දෙයිද? ස්වර්ගයේ සිටිය අපෙගේ පියා යහපත් දේ පමණයි ලබා දෙන්නේ. (ලූක් 11:9-13) (ලූක් 11:10) ඉල්ලන්නා ලබා ගන්නේය. ශු. ආත්මයාණන්ව උන්වහනසෙගෙන් ඉල්ලා ලබා ගන්න: මනමාලයා ඇතුල් වූවායින් පසු තෙල් ලබා ගන්න ගියා වූ කන්‍යාවන් ආපසු පැමිණි කල දොර වසා තිබුණු බව දුටුවේය. (මතෙව්25:1-9) එය ඔබට භායානක විනිශ්චය වේ.

104. ක්‍රිස්තුස් වහන්සේගේ ආත්ම නොමැති කෙනා උන්වහන්සේගේ නොවෙයි. පාවුල් තුමා පවසයි. (රෝම 8:9) ශු. ආත්මයාණන් බව්තිස්ම නැ කියා උගන්වන මෙවැනි ඉගැන්වීම් විශ්වාස නොකරන අයත් තමන්ව ක්‍රිස්තියානින් බව පවසන්නේ මන්ද?



10. විවිධ පූජාවල් පිළිබඳ ශුද්ධ වූ බයිබලයේ ලෙවී කථාවේ පළමු පරිච්ඡේදයේ සිට 07 වන පරිච්ඡේදය දක්වා සඳහන් වී ඇත. මේ තරම් පැහැදිලි විස්තර වෙන කිසිම පොතක සඳහන් වෙලා නොමැත. පුරාණ කාලවලදී පාප කමාව ලබා ගන්නා පිණිස බැටළුවන් සහ පරෙවියන් දෙවියන් වහන්සේට පූජා කරනු ලැබුව. සතුන්ගේ ලේ පාපවලට වැස්මක් ලබා දුන්නේය. මෙහි සඳහන් වී තිබෙන්නා වූ පූජාවල් යෙස්සුස් ක්‍රිස්තුස් වහන්සෙත් තමන් වහන්සේම පූජාවක් වී මනුෂ්‍යාගේ පාපයෙන් මිදීම ලබා දෙන ඡායාවක් ව තිබුණේය. නියමිත කාලයේ දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ පුත්‍රයාණන්ව ලෝකෙට දෙමින් ලෝකයේ පාපය උසුලන්නා වූ ශුද්ධ පූජාවක් කළ සේක. දෙවියන් වහන්සේ මෙසේ කළේ උන් වහන්සේ මනුෂ්‍යාට ප්‍රේම කළ නිසාය. යම් පව් කරුවෙක් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පූජා වූණෙ තමාගේ පාපය උදෙසා යැයි විශ්වාස කරමින් තමාගේ පාපය උන් වහන්සේට ප්‍රකාශ කරමින් පාපය අත්හරිනවා නම් ඔහුගේ පාපයට කමාව ලැබෙන්නේය.

11. දන් දීමෙන් නොව, යහපත් ක්‍රියාවලින් නොව, යහපත් හැසිරීමෙන් නොව, දෙවියන් වහන්සේටෙ නමස්කාර කිරීමෙන් නොව, පොරොන්දු ඉෂ්ඨ කිරීමෙන් නොව, සම්මාදන් දීමෙන් නොව මාගේ පාපය උදෙසා යේසුස් වහන්සේ පූජා වුණා. උන් වහන්සේ වැගිරෙව්වා වූ ලේවලින් මාගේ පාපයට සමාව ලැබෙන බව විශ්වාස කිරීමෙන් පමණක් අපිට පාප කමාවේ නිසැක තාවය හා ගැලවීම ලබා ගන්නෙමුව යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ලේ පූජා තුළින් පාපයෙන් ගැලවීම ලබා ගන්න පුළුවන් මෙයයි සුභාරංචිය. සියලු ජාතීන්ට මහත් ප්‍රීති උපදවන සුභාරංචිය මෙයයි.

12. පාප කමාව හා ආත්ම නොනැසීම, දෙවියන් වහන්සේ විසින් ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබේ. ප්‍රඥාවන්තයන් සහ උගතුන් මෙම මාර්ගයෙන් පැකිලිලා වැටෙනවා මේ පිළිබඳව යේසුස් වහන්සේ පැවසුවේ නුඹලා පසුතැවිලි වී කුඩා ළමුන් මෙන් නොවුණා නම් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නාහුය. මතෙව් 18:3. තවද උන් වහන්සේ පැවසුවේ ජීවනයට යන දොරටුව පටුය. පාර අවහිරය. ඒක සම්බන්ධ වන්නේ ස්වල්ප දෙනෙකුටය. (මතෙව් 7:14.)

13. දෙවියන් වහන්සේ කිසිම ආගමක් බිහි කළේ නැත.උන් වහන්සේ ආගම් වෙනස් වීම හා සභාව වෙනස් වීම ගැන දේශනා කළේ නැත.උන් වහන්සේ දේශනා කළේ සිත වෙනස් වීම ගැන සුභාරංචිය වේ. මේ නිසා යේසුස් වහන්සේ පැවසුවේ සිත වෙනස් වෙන, පසුතැවිලිවන සුභරංචි අදහා ගන්නා පිණිසය. (මාර්ක් 1:14-15). ආගම් මනුෂ්‍යන්ගේ නිර්මාණවල් පසුතැවිලි වීම අපට ලබා

දුන්නා වූ අලුත් ගිවිසුමය. ආගමිකයන් සහ සභා වාදයන් පසුතැවිලි වන්නේවත් පාපයට කමාව ලබා ගන්නේවත් නැත. ඔවුන් ස්වර්ග රාජ්‍යයට ඇතුල් වන්නේ නැහැ.

14. බොහෝ කිතුණුවන් පසුතැවිලිනොවී බව්තිස්ම ලැගෙන ඊජිප්තුවෙන් ගමන් ගත් ඊශ්‍රායල්වරු රතු මුහුද පසු කරලාත් ආපසු හැරී අපි ඊජිප්තුවේ සතුටෙන් සිටියා කියමින් කොඳුරපු ආකාරයෙන් තමන්ගේ පාපයට ආපසු හැරී යනවා. අනුග්‍රහයෙන් වර්ධනය නොවී පාරම්පරික දේවලින් හිරවෙන, පටු මාර්ග නොදැක සිටින්නේය. දෙවියන් වහන්සේගේ කරුණාව අදටත් අපට තිබෙන බැවින් පසුතැවිල වීම සඳහා අදටත්, එවැනි කිතුනුවන්ට අවස්ථාව ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබෙනවා.

15. ආගම්වලින් සහ ලෞකික ප්‍රඥාව නමැති බෙදුම්වලිනුත් හිරවී සිටින්නන්ට පහසුවෙන් දේශනා කරන්නා වූ පසුතැවිල්ල ඔවුන් පිළිගන්නේ නැත. මෙවැනි අය අන්ධ ආත්ම බැඳිම්වලින් හිරවී මිදිම නොලබා සිටිනවා. දුප්පතුන් අසරණ කම් නිසා ඔවුන්ගේ ස්වාමිවරුන්ගේ දෙවවරු පිළිගෙන අසරණ වී සිටිනවා. තමන්ට හොඳ කාලයක් උදාවෙයිදෝයි කියමින් සිටිනවා. මෙවැනි ජනතාවට ඉතා ප්‍රිතිදායක සුභාරංචියක් ඇත.

16. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දිළිඳුන් මිදිමේ සුභාරංචිය දේශනා කලේය. බිඳුණා වූ සිත් සුව කලේය. යක්ෂයාගේ හිරගෙයින් උන් වහන්සේ ඔවුන්ව නිදහස් කලේය. බැඳිම් නිදහස් කර හරින ලදි. මේ දේ කරන පිණිස උන් වහන්සේ ආලේප කරන ලද්දේය. (යෙසායා 61:1, ලූක් 4:18). අළු මත සිටින්නන්ත්නී ඇහුම්කන් දෙන්න. අළු වෙනුවට මාලාවකුත් , වැලපිම වෙනුවට ප්‍රිතිය නමැති තෛලයද, ක්ලාන්ත සිතක් වෙනුවට ප්‍රශංසාවද ලබා දී ධර්මය නමැති ගසක් මෙන් ඔවුන් දේශයේ වාසය කරති. (යෙසායා 61:3)

17. මෙවැනි දේවල් උන් වහන්සේ කරන්නේ කොයි ආකාරයෙන්ද? ස්වාමින් වහන්සේ කියන දේට ඇහුම් කන් දෙන්න. මම අලුත් සිතක් නුඹලාට දි, අලුත් ආත්මයක් නුඹ තුළ තබා, නුඹලාගේ මාංසයෙන් ගල් සිත පහ කොට, මාංසමය වූ සිතක් නුඹ හට දෙන්නෙමි. මාගේ ආත්ම නුඹලා තුළ තබා නුඹට මාගේ පනත් ප්‍රකාර හැසිර මාගේ විනිශ්චය පවත්වමින් ඒවා කරන්ට සළස් වන්නෙමි. (එසකියෙල් 36:26-27) උන් වහන්සේ දේශනා කලා වූ, තමන් වහන්සේගේ ශුභාරංචිය මෙයයි.



## සියළු දෙනා ආත්මයාණන් වහන්සේ විසින් එකම සිරුර තුළ ඉපදීම

95. පේත්‍රුස් පාව්ච්චි කලා වූ දෙවන යතුර යමෙක් දේව රාජ්‍යයේ ඇතුල් වෙනවා නම් ආත්මයාණන්ගෙන් ඉපදිය යුතුය. (යොහන් 3:5) මට පසු එන තැනැත්තා මට වඩා බලවත්ය. උන්වගහන්සේ ශු. ආත්මයාණන් ගෙන් ගින්නෙන් බවව්තිස්ම දෙන සේක. උන්වහන්සේ කුල්ල උන්වහන්සේගේ අතේය. උන්වහන්සේ තම කමත හොඳ හැටි පවිත්‍ර කරන සේක. තමන් ධාන්‍ය අටුව රැස් කරන්නට බොල් නොනිවන ගින්නෙන් දවන සේකයි කීවේය. (මතෙව් 3`11, 12)

96. ඉහත සඳහන් වචන ශු. ආත්මයෙන් බව්තිස්ම නෑ කියලා සඳහන් වෙනවාද?. දේව වචනය පවසන දේ හරි. ශු. ආත්මයානන්ව නොලබපු තැනැත්තා ස්වර්ග රාජයට ඇතුල් නොවන්නේය. එසේ නම් ශු. ආත්මයාණන් ගෙන් බව්තිස්ම නෑ කියන්නා වූ තැනැත්තා ඉපදී තියෙන්නේ කා කරණකොටගෙනද?. ක්‍රිස්තුස් වහන්සේ වෙනස් නොවන්නා වූ තැනැත් වහන්සේ (හෙබ්‍රෙව් 13:8) උන් වහන්සේගේ වචනය නොවෙනස්ය. (මතෙව් 24:35) අදත් ඒ ආත්මයේ ක්‍රියා කරන සේක. යේසුස් වහන්සේව ගැලවුම්කරු හැටිය නොපිළිගත් කොයි තැනැත්තාත් පාපයෙන් සිටිනවා. ඒ ආකාරයෙන් ශු. ආත්මයානන්ව පිළිනොගන්නා වූ වරද නම් කමා කරනු නොලැබේ. (මතෙව් 12:31. 32)

97. අප උදෙසා මැරුණා වූ යේසුස් වහන්සේගේ මරණයට කොටස් කරුවෙක් වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලැබීම අවශ්‍ය වේ. ඒ ශු. ආත්මයාණන්ගේ බව්තිස්මත් එපා යයි කියනවා නම් එයින් හැඟී යන්නේ පැමිණීමට තිබෙන දේව රාජ්‍යයේ ඔබට ඉඩ එපා යයි කියාය. පළමුවෙන් දේව රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ද සොයන්න. දෙවියන් වහන්සේ පවසන්නේ කොන්දේසි සම්පූර්ණ නොකොට ඔබගේ රාජ්‍ය ඒවා කියමින් යාච්ඤා කිරීමෙන් නම් පල කුමක්ද?.

98. ජම්මික මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරණා පිළි නොගනියි ඔහුට ඒවා මෝඩ කමක්ය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්නට ඔහුට බැරිය. (1කොරන්ති 2:14) ඔබගේ ස්වභාවය මේ කැඩපතින් බලා ගන්න. උන්වහන්සේ ඉක්මනින් එන සේක.

99. ගෝලයින් සහ අනිකුත් ඇදහිලිවන්තයන් 120 දෙනෙක් උඩුමහලේ රැඳී සිටියේය. ආත්මයාණන්ව ලැබූ සේක. (ක්‍රියා 2:14) සමාරිවරු අදහා ගත් සේක. පේත්‍රුස් සහ යොහන් අත තබා යාච්ඤා කළ විට ශු. ආත්මයාණන්ව ලැබුවේය

91. යෙසායා අනාගත වක්තෘ තුමාගේ අනාවැකිය අනුව කන්‍යාවක් තුලින් ලැබුනා වූ තැනැත්තාට ඉම්මානුවෙල් යන නාමය තබන්නට තිබුනේය. එම නාමයේ අර්ථය නම් දෙවියන් වහන්සේ අප සමගය යනුයි. පළමු මනුෂ්‍යය ආදම් පොළවේ බිහි වුනා. දෙවැන්නා ඉහළ අහසේ සිට පැමිණියා වූ ස්වාමීන් වහන්සේ (1 කොරින්ති 15:47)

92. ස්වර්ගයට නැගී බැස ආවේ කවුද? උන්වහන්සේගේ නාමය කුමක්ද?. (හිතෝපදේශ 30:4) පියාගේ නාමය පුත්‍රයා එළිදරව් කළා (යොහන් 17:6) කෙසේද එළිදරව් කලේ. මම මාගේ පියාගේ නාමයෙන් පැමිණියෙමි. නුඹලා මාව පිළිනොගත්තේය. (යොහන් 5:43) එසේ නම් පියාගේ නාමය කුමක්ද? ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය පියාගේ නාමය නොවේද?. මෙය අද කාලේ උගතුන්ට හා නුවණ ඇත්තන්ටත්, පරිසිවරුන්ටත්, සද්දුසිවරුන්ට තේරෙන්නේ නැත. එම නිසා ඔවුන් පිළිගන්නේවත් අදහන්නේවත් නැත. සදා කාල ජීවනය ලැබෙන්නේත් නැ. (යොහන් 17:3) උන්වහන්සේ සැබෑ වූ තැනැන් වහන්සේය. (1 යොහන් 5:20) සදා කාල ජීවනයයි.

93. පියා, පුත්‍රයා, ශු. ආත්මයාණන් වහන්සේ එක නාමයයි එළිදරව්වූ නාමය මෙයද ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ නාමයයි. මේ නාමයෙන් බව්තිස්ම ලබා දෙන පිණිස, යේසුස් වහන්සේ තමන් වහන්සේගේ ගෝලයන්ට අණ කළ සේක. ඒ නාමය පෙන්තකොස්ත දවස දක්වා එළිදරව් වුනේය. ගොලයන් ශු. ආත්මයානන්ව ලැබුවා. පේත්‍රුස් දේශනා කළා. බොහෝ අය පසුතැවිලි වුනා. පසුතැවිලි වුනා වූ අය දෙස පේත්‍රුස් කීවේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්සිත්ම ලබා ගන්නා පිණිසය. එදින 3000 බව්තිස්ම ලබුවා. පේත්‍රුස් වෙත තිබුනා වූ ශු. ආත්මයාණන් අද කාලයේ යම් ගෝලයින් මත නම් ඔහුත් ඒ නාමයෙන් බව්තිස්මය ලබා දෙන්නේය. මෙයයි සැබෑව. බව්තිස්ම පිළිබඳව සැබෑව.

94. පාරම්පරික ඉගැන්වීම් අතහැර බයිබලයට හැරී එන්න. ප්‍රේරිතයන් අනාගත වක්තෘන් වැනි අත්තිවාරම් මත ගොඩනගන්න. (ක්‍රියා 2:28) එපීස 2:20 ප්‍රේරිතයන් ලබා දුන්නා වූ එකම බව්තිස්ම ලබමින් වචනය මත රදා පවතින්න. උන්වහන්සේගේ ඒම ඉතා ලඟය. නමුත් මනුෂ පුත්‍රයා එන කල ඇදහිල්ල තිබේදැයි කී සේක. (ලූක් 18:8) කතෝලික පාරම්පරික ඉගැන්වීමේ හැරී ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මත ගොඩනගපු බව්තිස්මයට හැරුණා වූ සෙනඟව උන්වහන්සේ දකියිද?.



18. උන් වහන්සේ ඔබගේ සිතත් ආත්මයක් වෙනස් කර පසුතැවිලිවීමට සලස් වන සේක. පසුතැවිලිවීමට සිතක් ඇතොත්, උන් වහන්සේ ඉතිරි කොටස බලා ගනීවි.

19. දේව රාජ්‍යට ඇතුල්වීමට කැමති අය මෙවැනි පසුතැවිලි වූවායින් පසු වතුරෙනුත්, ආත්මයාණන්ගෙන් ඉපදීම යුතුව තිබෙනවා. වතුරෙනුත්, ආත්මයාණන්ගෙනුත් ඉප දෙන්නේ කෙසේද ?

20. ලෞකික නමස්කාර වලිනුත් පාපවලිනුත් තමාගේ සිත මුළුමණින්ම දෙවියන් වහන්සේ වෙත හැරුණාවූ කෙනෙක්. ලෞකික දේවල් මගින් ඔහු, මැරුණා වූ කෙනෙක් වෙනවා. යම් මුනුෂ්‍යයෙක් මැරුනොත් ඔහු නැවතත් ප්‍රාණවත් වන්නේ නැත. පාපින්ට කෙනෙක් මැරුණා නම් ඔහු නැවත ලෝකයට ඇවිත් කලා වූ පාපය නැවත කරන්නේ නැත. මේ ආකාරයෙන් ලෝකයේ පසුතැවලි වුණා වූ නැවත පාපිෂ්ඨ දේවල් කරන්නෙ නැත. පසු තැවිලි වුණා වූ අය ලෞකික දේවලින් මැරුණ අය වේ. ඔහු ලෝකයේ පාප සමාව පිණිස පූජා සඳහා වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ උන් වහන්සේගේ සොහොනේ තැන්පත් කරනු ලබයි. ක්‍රිස්තුස් වහන්සේගේ සොහොන්ගෙට වතුර ජායාවක්. පසුතැවිලි වුණා වූ කෙනා ස්වාමීන් වහන්සේගේ නාමයට නමස්කාර කරමින්, තමන්ගේ පාපය පහ කරනු ලැබූ වතුරෙන් බව්තිස්ම ලබා අලුත් මනුෂ්‍යයෙක් වෙනවා. (ක්‍රියා 22:16) එබැවින් වතුරෙන් ලැබෙන්නා වූ බව්තිස්මය වතුරෙන් ඉපදීමද ආත්මයාණන්ගෙන් ලැබෙන්නා වූ බව්තිස්මය ආත්මයාණන්ගෙන් ඉපදීමද වේ.

21. බව්තිස්මය යනුකුමක්ද ? බව්තිස්මය කියන්නා වූ වචනය Baptizo කියන්නා වූ හෙබ්‍රෙව් වචනය යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පිළිගත්තායින් පසු පාපයෙන් පවිත්‍ර වූ බවට ස්ථිරතාවයක් ලැබීම. වතුරෙන් ස්නානය කිරීම පිරිසිදු කමක් පෙන්වයි. යමෙක් වතුර බව්ටිස්ම ලබන කල ක්‍රිස්තුස් වහන්සේ සමඟ තැන්පත් කරනු ලබයි. වතුරෙන් එළියට ඒමේ දී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ නැවත උත්තානය පෙන්නුම් කරයි. ඔහුද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත ඒමේ දී ඔහුද නැවත නැගිටවනු ලබයි. යේසුස් වහන්සේ සමඟ තැන්පත් නොකල තැනැත්තා නැවත නැගිටුවීමේදී කොටස්කරුවෙක් නොවන්නේය.

22. ඉහත සඳහන් කරුණ පවා, වතුරෙන් ඉපදීම ලැබීම පවා ප්‍රඥාවන්තයන්ට සහ උගතුනට වැසී තිබේ. දරුවන්ට ප්‍රකාශ වී තිබේ. මෙය දිළිඳු කරුණක් වූ බැවින් නුවණ ඇත්තා හා ප්‍රඥාවන්තයන් මේ වැනි අය දකින්නේ නැත. මේ දේවල් පිළිබඳව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ``පියාණනි ඔබ වහන්සේ

ප්‍රඥාවන්තයන්ටත් නුවණ ඇත්තන්ටත් මේ කාරණා සඟවා බාලයන්ට එළිදරව් කළ බැවින් ඔබට ස්තුති කරමි``යි පැවසුවේය.(ලූක් 10:21)

23. උගත් උපාධිධාරීන් සහ ක්‍රිස්තියානි දේව ධර් ම විද්‍යාහල්වල බයිබලය ගැනත් අනෙකුත් පොත්පත් ඉගෙන ගෙන උසස් උපාධි ලබා උසස් තිල දරණ අය සහ සභාවල්වල නායකත්වය දරණ අයටත්, යේසුස් වහන්සේගේ දිළිඳු සරල ඉගෙනීම් තේරුම් නොගෙන පැකිලී වැටීම දෙස බලන්න.

24. මෙවැනි උගතුන් නුවණ ඇත්තන් ජලයෙන් දිය යුතුව තිබෙන එකම බව්තිස්මය නොයෙකුත් වෙනස් වූ ආකාරයෙන් දීම දැකිය හැක. සමහරුන් වතුර ඉසීම හරි කියමින්ද තවත් සමහරුන් ගිල්වීමේ බව්තිස්මය හරි කියමින්ද සමහරුන් වතුර එක්වරක් ඉස මත ඉසීම හරි කියමින්ද තවත් සමහරු තුන් වතාවක් ඉස මත වතුර ඉසීමද තවත් සමහරු ගිල්වීමද නිවැරදි යැයි පවසයි.

25. සමහරුන් කුඩා දරුවන්ට බව්තිස්ම දෙනු ලබයි. තවත් සමහරුන් වැඩිහිටියන්ට සහ තරුණයන්ට පමණක් බව්තිස්මය කරනු ලබයි. තවත් සමහර අය දස පනත සහ ස්වරග යාඥාව කටපාඩම් කළා වූ අයට බව්තිස්ම දෙනු ලබයි. තවත් සමහරු ඉස මත වතුර බාල්දියක් වත් කර බව්තිස්මය දෙනු ලබයි. තවත් සමහරු වතුර අවශ්‍ය නැත කියා අතට අත දෙනවා. සභාව ඉදිරියට කැඳවලා මම නුඹට පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධ ආත්මයාණන්ගේ නාමයෙන් බව්තිස්ම කරනවා කියමින් බව්තිස්ම කරනු ලබයි.

26. තවත් සමහරුන් පවසන්නේ ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසිපත් සොරා, බව්තිස්ම නොලබා පාරාදිසයට ගිය බැවින් බව්තිස්මය අවශ්‍ය නොමැති බව උගන්වමින් බව්තිස්මය නොකරන බව අපි දන්නෙමු. මෙයද සියලුම ජනතාව හොරුන් කිරීමයි.

27. මෙවැනි බව්තිස්ම කරන්නා වූ අය සාමාන්‍ය අය නොවෙයි. ඔවුන් නුවණ ඇත්තන් සහ උගතුන්ද වේ. අපි ශුද්ධ ආත්මයාණන්ව ලබාපු අය බවට ප්‍රකාශ කරන අය වේ.

28. මේ ආකාර බව්තිස්ම කරන පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේගේ ගෝලයින්ට අණ කළා ද?

29. නැත.

30. එසේනම් උගතුන් සහ නුවණ ඇත්තෙන් කොහෙන්ද මේ වැනි අණ ලබා ගත්තේ. කාගෙන්ද ලබා ගත්තේ ? මේ තරම් නොයෙක් ආකාර බව්තිස්ම



85. පියා යනු නාමයක්ද? මෙය නාමයක් නම් ඔබගේ පියාගේ නාමය පියාද?. ඔබේ පියාගේ පුතා වූ ඔබට නාමය පුතාද?. පොදු නාමයන් ශු. ආත්මයාණන් වහන්සේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නාමයන් යවනු ලැබුවේය. (යොහන් 15:16) පියා පුත්‍රයා ශු. ආත්මයාණන් වහන්සේ යනු තනතුරු වල නාමයයි. නමුත් එක නාමයක් තිබෙනවා. යෙහෙවා යීරේ යන ස්වාමින් වහන්සේ සපයන්නා වූ තැනැත්වහන්සේය. යොහාවා නිසි පිළිතුරු දෙන්නා වූ තැනැත්වහන්සේ ය. අදෝනි ගැලවුම් කරු ආලෝකය මග පෙන්වන්නා වූ මෙවැනි තනතුරු නාම තිබෙනවා. පියාගේ සහ පුත්‍රයාගේ නාමය නුඹ හඳුනනවා ද?.

86. මම මාගේ පියාණන්ගේ නාමයෙන් පැමිණ සිටිමි. නමුත් නුඹලා මාව පිළිගත්තේ නැ. (යොහන් 5:43) උන්වහන්සේ කාගේ නාමයෙන් ද ආවේ. ? පියාණන්ගේ නාමයෙන් ! එසේ නම් පියාගේ නාමය කුමක්ද?. යේසුස් වහන්සේ යාච්ඥා කරන කල්හි (යොහන් 17:6, 11, 12, 16) ඔවුන්ව ඔබගේ නාමයෙන් රැකගත්හ. කාගේ නාමයෙන්ද? පියාගේ නාමයෙන්, ඔබගේ නාමය ඔවුන්ට ප්‍රකාශ කළා. ඒ එළිදරව්වූ නාමය කුමක්ද? පියාණෙනි ඔවුන්ව ඔබගේ නාමයෙන් රැක ගන්න යයි කිව්වේය. ඒ නාමය කුමක්ද?.

87. අපි ගැලවීම ලැබෙන පිණිස අහසේ යට මනුෂ්‍යයන් අතරේ උන්වහන්සේගේ නාමය හැර (ඒ නාමය හඳුනා ගන්න) වෙන කිසි නාමයක් නැත. (ක්‍රියා 4:12)

88. ඒ ගැලවීම ලබා දෙන්නා වූ නාමය කුමක්ද?. එම පරිච්ඡේදී අණ කළ නාමය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයයි ! මෙම නාමයෙන්මයි ශු. ආත්මයාණන් එවන ලදි. (යොහන් 14: 26) එබැවින් වචනයෙන් හෝ ක්‍රියාවෙන් මොනම දේ කළත්, බව්තිස්ම පවා ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් කළ යුතුව තිබෙනවා. (කොලස් 3:17) ඒ නාමය බව්තිස්ම නොදී වලක්වා පියා, පුත්‍රයාණන්, ශු. ආත්මයාණන් ගේ නාමයෙන් කියමින් කතෝලික බව්තිස්ම ලබා දෙන්නේ කෙසේද?.

89. බලන්න අපට ලැබුණු ළදරුවා, අපිට දෙන ලද්දා වූ පුත්‍රයා කිස්තුස් වහන්සේය. සදාකාල පියානන්ය. (යෙසායා 9:6) පියා, පුත්‍රයා, ශු. ආත්මයාණන් වහන්සෙගේ නාමය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

90. මමද පියාණන් වහන්ස් ද එක තැනැත්තාය. (යොහන් 10:30, 31) උන්වහන්සේට ගල් ගසන පිනිස නැවත වරක් යුදෙව්වරුන් අතට ගල් ගත්තේය. අදත් ඒ වැනි දේමයි. පියා සහ ක්‍රිස්තුස් වහන්සේ එක්කෙනාමයි කීවොත්, ගල් ගසන එවැනි ආත්මයම අදත් ක්‍රියා කරනවා.

80. එක් වතාවක් භාර දෙන ලද ඇදහිල්ල අවිස්වාස කරන කොට ගෙන අඳුරු වෙන්න පටන් ගත්තා. පළමු ඉගැන්වීම - පලගැටින් ඉතුරු කර ඒවා පලගැටියෝ කැවෝය. නමුත් මේ ආකාරයෙන් නැති වුනා වූ ඉගැන්වීම් නැවත ලබා දෙන්න දෙවියන් වහන්සේ පොරොන්දු වී තිබෙනවා. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ නාමයෙන් ලබා දෙන්නා වූ බව්තිස්මයත් නැවත ලබා දුන්නා වූ ඉගැන්වීමයි.

82. මතෙව් 28:19 ක්‍රියා 2:38 එකම බව්තිස්මයයි මතෙව් 28:19 ගැඹුරෙන් තේරුම් නොගෙන උගතුන් හා නුවණ ඇත්තවුන් වැරදි විදියට වටහාගෙන තිබෙනවා. ප්‍රෙරිතයන් ලබා දුන්නා වූ බව්තිස්මය, මම නුඹට ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා දෙමි. ක්‍රියා 2:38, 8:15, 19:5 මෙම බව්තිස්මයට පේත්‍රුස්, පිලිප්, පාවුල් තුමා සාක්ෂි දැරිය. අද කාලයේ දි උගතුන් සහ නුවණ ඇත්තන් ලබා දෙන්නා වූ බව්තිස්මය නම්, මම නුඹට පියාණන්, පුත්‍රයාණන්, ශු. ආත්මයාණන් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම කරමි යනුයි. (මතෙව් 28:19) මෙම බව්තිස්මය ක්‍රි. පු. 325 වෙනි වර්ෂයේදි රෝමානු කතෝලික සභාවේ ඉයිම බව්තිස්මයෙන් ආරම්භ වී අද කාලයේ පෙන්තකොස්ත සභාවේ තුන් වතාවක් ගිල්වීමේ බව්තිස්මයෙන් දැක ගන්නට පුළුවන. මේවා කතෝලික සභාවේ සුදු ලෝගුවේද ලංකා පෙන්තකොස්ත සභාවේ සුදු වෙට්ටි වලින්ද අලංකාර වී තිබුණා. (මතෙව් 28:19) වැසී තිබෙන්නා වූ රහස ඔවුන්ගේ බව්තිස්මවලත් නැත. මතෙව් 28:19 දෙස බලමු. ඒ බැවින් නුඹලා ගොස් සියළු ජාතින් ගෝලයින් කරපල්ලා. පියාණන්, පුත්‍රයාණන්, ශු. ආත්මයානන් වහන්සේගේ නාමයෙන් ඔවුන් බව්තිස්ම කරපල්ලා.

83. පියාණන්, පුත්‍රයාණන්, ශු. ආත්මයාණන් ඒක වචනයද නොහොත් බහුවචනයද? බහුවචනය නම් නාමවල්වලින් කියාත් තිබිය යුතුයි. ඒක වචන නම් නාමය යනුයි. ඉහත සඳහන් තුනම එකම නාමයයි. (ලූක් 24:47) පසු තැවිලි සහ පව්කමාව උන්වහන්සේගේ නාමයෙන් දේශනා කළ යුතුය. ඒක වචනයක් වූ මේ නාමය පෙන්තකොස්ත දවසේදි ශු. ආත්මයාණන් ඔවුන් පිටට ආ කල්හි ස්වර්ග රාජ්‍යයේ යතුර යේසුස්ගේ මුවින් එළිදරව් වුහ. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා ගනිල්ලා යැයි කී සේක. (ක්‍රියා 2:38) එවිට 3000 ක් බව්තිස්මය ලබා ගත්තේය.

84. එසේනම් පියාණන්ගේ නාමය කුමක්ද?. පුත්‍රයානන්ගේ නාමය කුමක්ද?. පුත්‍රයාණන්, භු. ආත්මයාණන්ට එක නාමය තිබෙන බව පෙන්තකොස්ත දවසේදි ගෝලයින වටහා ගත් සේක. නමුත් මේ සියල්ල දැකලාත්, කියවලාත් තේරුම් නොගන්නා වූ මේ අවසාන කාලයේ ගෝලයින් අන්ධව සිටින්නේ මන්ද?



කොහෙන්ද පැමිණියේ ? වටහා ගන්න පළුවන්ද ?

31. මේ වැනි බව්තිස්ම පැමිණියේ ලෝකයේ ගුරුකම්වලින්, පරම්පරා ගත නියෝගවලිනුත් හැර ක්‍රිස්තුස් වහන්සේගෙන් පැමිණියේ නැත. (කොලෙසි 2:8)

32. යේසුස් වහන්සේ පැවසුවේ අපගේ ඇදහිල්ල නැමති පර්වත මත සාදන්න කියා. වැලිමත නොවෙයි. (මතෙව්7: 24-29) එම පර්වත නම් ක්‍රිස්තුස් වහන්සේගේ වචනයයි. අප ගොඩනගා ගත යුත්තෙ උන් වහන්සේගේ වචනය මතය. උගත්කම් මත, නුවණ මත, ගොඩනගන්නා වූ දවස සීග්‍රයෙන් පැමිණෙන්ට යන්නා වූ විනිශ්චය දවසේදි කඩා වැටෙයි. එබැවින් අද දවසේ දී නොයෙකුත් බව්තිස්ම පිළිබඳව සෝදිසි කර බලමු. වචනය සමඟ සන්සන්දනය කර බලමින් වචනය මත තිබෙන්නා වූ ඉගැන්වීම් තදින් අල්ලා ගනිමු. (1 තෙසලෝනික 5:21)

## ඉසීමෙන් ලබා දෙන්නා වූ බව්තිස්මය

33. නපුරු හෘද සාක්ෂියකින් පිරිසිදු වීම පිණිස අපගේ සිත් ඉසිනු  ලැබ අපගේ ශරිරය පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ සැබෑ වූ සිතක් ඇතිව ඇදහීමේ නිසැකකමින් ළගා වෙමු. වතුර ඉස මත ඉසිමෙන් දෙන බව්තිස්මය හරිද? මෙම ප්‍රශ්න මතු කරපුවාම සමහර කිතුනු සහෝදරවරුන්ට තරහා යනවා. මෙම කුඩා පොත තුළින් ලෝකයේ ලබා දෙන්නා වූ සියලුම බව්තිස්ම ගැනත් එය දේව වචනය සමඟ සන්සන්දනය කර බලන්නට යන නිසා ටිකක් ඉවසිලිවන්තව සිටියොත් සත්‍යය කුමක් දැයි අපට වටහා ගන්නට පුළුවන්. සැබෑව පමණයි අපව නිදහස් කළ හැකි. සැබෑව සියලු ලෞකික බැඳුම්වලින් අපව ආරක්ෂා කරයි. (යොහන් 8: 32)

34. කිතුනුවන් වන අපි දේව වචනය මත ගොඩනැගිය යුතුයි. ඒ අරමුණු කොට මෙම පොත ලියවෙන්නේ බයිබලයේ නොමැති දෙයක් ගැන තර්ක කිරීම දෙවියන් වහන්සේ ඉදිරියෙ පිළිකුලක්ය. (යෙසායා 66:1,2,5) අපේ සිත බයබලය වෙතට හැරිය යුතුයි. දේව රාජ්‍යය ළංව තිබේ.

35. නෝවාගේ අට දෙනෙක් බව්තිස්ම කරනු ලැබුවාලු. (1 පේත්‍රුස් 3:20-21) නැව උඩ සහ යට වතුර තිබුණේය. ඊජිප්තුවෙන් ගමන්ගත් ලක්ෂ 6 ක් බව්තිස්ම ලැබුවාලු. 1කොරි 10:1-15. දෙපැත්තෙන්ම වතුර සහ ඉසට ඉහළ වළාකුළු තිබූ බවට සඳහන්වෙලා තිබෙනවා. ඔවුන්  වළාකුළු තුළින් බව්තිස්ම ලැබුවාලු.

36. අලුත් ගිවිසුමේ පළමු වතාවට බව්තිස්ම දෙනු පිණිස අනුමත ලැබුවේ යොහන් බව්තිස්ත . ඔහු ජෝර්දාන් ගඟේ බව්තිස්ම කර (යෝහන් 1:28) සාලිම් යන ස්ථානයේ වතුර තිබුණු බැවින් යෝහන් එම ස්ථානයේ බව්තිස්ම දුන්නේය. සෙනඟ ඔහු වෙතට පැමිණ බව්තිස්ම ලබා ගත්තේය. (යෝහන් 3:23)

37. නෝවා සමඟ සිටියා වූ 8 දෙනා බව්තිස්ම ලබා ගන්නට ජල ගැල්මත් ඊශ්‍රායල්වරු ලක්ෂ 6 ක් බව්තිස්ම ලබා ගැනීමට රතු මුහුද සහ වලාකුළු අවශ්‍ය වී තිබුණා. යොහන් තුමා ලබා දුන්නා වූ පසු තැවිල්ල බව්තිස්මය ලැබීමට ගැඹුරු තැනක් අවශ්‍යය වුණා.බයිබලයට එකඟ විය හැකි දෙයක්ය.වචනය වූ ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධ වීමයි. ඉසීම බව්තිස්ම. මෙය ඉතිහාසය අපට පෙන්වා දෙන්නේ කතෝලික පාරම්පරික මුහුන් ඉගැන්වීමයි.

38. ප්‍රිය මිත්‍රය ඉසීම ස්නානයක් ද? නොහොත් ස්නානය යනු ඉසීමද ඉසීම සහ ස්නානය ක්‍රියාව දෙකක්. ඇයි ඔබ තේරුම් නොගන්නේ. ඔබේ මුරණ්ඩුකම සභාවේ ඉගැන්වීම් මත බිහි වී තිබෙන බව අවබෝධ කල යුතුයි. දේව රාජ්‍ය ලංව තිබේ.

39. යේසුස් වහන්සේ බව්තිස්ම ලබා දියෙන් ගොඩ නැගුණ සේක. (මතෙව් 3:16) සඳහන් වී ඇත. උන් වහන්සේ වතුරට බැස්සාය. අවධානය යොමු කරන්න, එතියෝපියාවේ නපුංසකයාට පිලිප් බව්තිස්ම කළේ (ක්‍රියා 8: 38) ඔවුන් දෙදෙනාම වතුරට බැස්සාය. ඉසීමේ බව්තිස්ම නම් ඇයි ඔවුන් දෙදෙනාම වතුරට බැස්සේ. මේ පිළිබඳව පාවුල් තුමා පිළිතුරු දෙයි.

40. ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ බව්තිස්ම වූ අප සියල්ලෝම උන්වහන්සේගේ මරණයට බව්තිස්ම ලැබූ බව නුඹ නොදැන සිටිනවා ද? මරණයට පත්කරාන්නා වූ බව්සතිස්ම ලැබූ අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවේය. (රෝම 6:3-4)

41. ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ බව්තිස්ම ලැබුවාවූ අපි උන් වහන්සේ සමඟ වළලනු ලැබූ බවට පාවුල් තුමා සඳහන් කරයි.ඉසීම යනු වල දැමීම නොවෙයි. වල දැමීම යනු වලක් හාරා ඒ තුළ තැන්පත් කිරීමයි.ශරීරය මුළුමණින්ම වතුරෙන් ගිල්ලීම තැන්පත් කරීමට සමානයි.

42. මවු කුසෙන් මුළුමනින්ම ශරීරය පිටතට ආ කල එය හඳුන්වන්නේ ඉපදීම යනුයි. අපගේ ශරීරය මුළුමනින්ම වතුරෙන් ගිල්වන්නේ නැත්නම් වතුරෙන් ඉපදීම කෙසේද හඳුන්වන්නේ.? වතුරෙන් ගිල්වන විට අප ක්‍රිස්තුස් වහන්සේ



ක්‍රිස්තියානි අය කාගේ තුළද බව්තිස්ම ලැබුවේ. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළයි.

අ. පාවුල්තුමා ගලාතිවරුන්ට ලියූ ලිපි තුලින් ක්‍රිස්තුස් වහන්සේ තුලින් ගලාතිවරුන් බව්තිස්ම ලැබූ බව කියයි. මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළට බව්තිස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස් වහන්සේ පැළඳ ගත්තෝය.

ආ. කොලොසිවරුන් බව්තිස්මයෙන් ක්‍රිස්තුස්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවා. (කොලොසි 2:11-13) රෝම, ගලාති, කොලොසි, මොවුන් ලබා ගත් බව්තිස්මය ඔබ දන්නවාද? ලාංකික කිතුණුවනි අහසේ යට මනුෂ්‍යන් අතර ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය මිස අප ගලවන්න වෙන නාමයක් නොමැති බව දැනගන්න (ක්‍රියා 4 :12)

## ඉතිහාසයේ ලැබෙන සාක්ෂි

78. ක්‍රි. පූ. 325 වෙනි වර්සය දක්වා දේව රාජ්‍යයේ සුභාරංචිය අදහාගෙන් පසු තැවිලි වුනා වූ අයට ප්‍රේතයන් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා දුන්නේය. පසුව රෝමයේ කතෝලික සභාවේ නිලධාරීන් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහනයේගේ නාමය අහක් කොට පියාණන් වහන්සේ ශු.ආත්මයාණන් වහන්ස් පුත්‍රයාණන් වහන්සේ නාමය ඇතුල් කොට බව්තිස්ම ලබා දුන්නේය.

මේ පිළිබඳ කරුණු පහත සඳහන් කොට ඇත.

අ. Scribner නැමති පොතේ 241 වෙනි පිටුව

ආ. Canney නමැති පොතේ 53 පිටුව

ඇ. Jameshastinap නමැති පොතේ පොත්වල බව්තිස්ම නමැති මාතෘකා.

79. ශුද්ධවන්තයන්ට පටන් ගැන්මේදී ලබා දුන්නා වූ සුභාරංචිය මෙයයි (යුද්. 3) ගැලවීමේ උදෙසා දෙන ලද නාමය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය පමණයි.! ක්‍රිස්තුස් වහන්සේ මත උන්වහන්සේගේ සභාව අත්තිවාරම දමන ලදි. මෙම නාමය පරිසිවරු සහ සද්දූසිවරු විසින් අහක දැමූවා. එම ගලම සභාවට මුල් ගලක් වූවාය. අද දවසේ උගතුන් සහ නුවණ ඇත්තවුන් බව්තිස්මයේ මෙම වැදගත් නාමය අහක්කොට කතෝලික බව්තිස්ම වූ පියාණන්, පුත්‍රයානන්, ශු. ආත්මයාණන් ලබා දෙමින් සිටිනවා. තමන් තමන්ව රවටා ගන්නවා.

73. පේත්‍රුස් හා පිලිප් තුළ සිටියා වූ ශු. ආත්මයාණන් වහන්සේ අද දවසේ යම් දාසයෙක් තුළ සිටිය ද ඔහු ද පිලිප් සහ පේත්‍රුස් ලබා දුන්නා වූ බව්තිස්මය ලබා දෙනවාමයි. මිදි අතු රිකිලි දමනවා නම් එම අන්තයෙහි මිදිම ඵල දරණවා නොවෙයිද ඵල වලින් ගස හඳුනා ගන්න. (මතෙව් 7:16)

## පාවුල්තුමා - තුන්වන සාක්ෂිය

74. අලුත් ගිවිසුමේ පොත් 24 න් 14 ක්ම ලියන ලද්දේ ශු.පාවුල් තුමා විසිනි. පාවුල් තුමා අනිකුත් අපෝස්තලවරුන්ගෙන් ඉගෙන ගත්තේ නැත. පාවුල්තුමාට ක්‍රිස්තුස් වහන්සේම එළිදරව් කළ සේක. (ගලාති 1:14 - 14, 18, 20) අන්‍ය ජාතිකයන්ට දේශනා කාරයෙක්ද, ප්‍රේතයෙක්ද, ගුරුවරයෙක් මෙන් ද පත් කරන ලද්දා වූ කෙනෙක්ය. 2 තිමෝති 1:10 - 11, ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය නිසා ඔහු ලැබුවා වූ පීඩාව, අපහාසය අනිකුත් ප්‍රේතයන් දරාගත් බවට කිසිදු සාක්ෂියක් නොමැත. ඔහුගේ සාක්ෂිය අහකට දමනවා ද?.

75. අද දවසේ යේසුස් වහන්සේ උගන්වපු (මතෙව්. 28:19) වචනය පමණයි අපි පිළිගන්නේ ප්‍රේතුස් තුමා උගන්වපු (ක්‍රියා 2:38) පිළිගත්තේ නෑ කියන්නා වූ අය මේ දෙස බලන්න. පාවුල් තුමා යේසුස් වහන්සේ විසින් ම උගන්වපු කෙනෙක්ය.

76. පාවුල්තුමා එපීසියට ගිය කල්හි යොහන් බව්තිස්ම කළා වූ ගෝලයින්ව දැක එම බව්තිස්ම නොව ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා ගන්නා පිණිස දේශනා කළේය. එය ඇසූ කල්හි ඉවුන් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබා ගත්තේය. (ක්‍රියා 19:5) නමුත් අද ඉසීම, වැක්කිරීම අතට අත දීම වැනි බව්තිස්ම ලැබූ අය බැටළු රැළ එඬේරාට කිකරු වෙන්නා මෙන්, දේව වචනයට කිකරු වී පිළිගන්නවාද: නමුත් යේසුස් වහන්සේ බැටළුවන්ට එඬේරාය. මෘගයන්ව උන්වහන්සේ එකතු නොකරන්නේය.

77. ශු. පාවුල් තුමා ස්වාමි යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ලබා දුන්නා වූ බව්තිස්මය පිළිබඳව සාක්ෂි තුනක් තිබෙනවා.

රෝමයේ සිටියා වූ සියළුම ඇදහිලිවන්තයන්ම ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලැබූ අය බව සැකද?. ඔහු ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ බව්තිස්ම ලැබූ අපි සියළු දෙනා (පාවුල් තුමා සහ රෝමේ සිටියා වූ සියළු ම ඇතහිලිවන්තයන්) උන්වහන්සේගේ මරණය තුලින් වූ බව්තිස්ම ලැබූ බව ඔබ නොදැන සිටිනවාද? කියමින් ලිවේය (රෝම 6:3).



සමග වළලනු ලබමුව. පිටතට ආ කල අලුත් ඉපදීමක් මෙන් අපි අලුත් ජීවිතයක් ලබමුව. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්තාන වූ ආකාරයෙන් අපිත් උත්තාන වෙන බව විශ්වාස කරමු. මෙය ඉසීම නොව ඉපදීමයි.

43. ඒ බැවින් ඔබ ගිල්වීමේ බව්තිස්මය ලබා නැත්නම් ඔබ වතුරෙන් ඉපදීමක් නෑ. එබැවින් මේ දක්වා ඔබ සිටින්නේ රාජ්‍යය පිටයි. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සමඟ තැන්පත් නොකල තැනැත්තා උන්වහන්සේගේ උත්තානයේත් හවුල් කරුවෙක් නොවන්නෙයි.

44. ස්නානය යනු ඉසීම නොවේ. මෙය සේදීම සහ අර්ධයක් නොවෙයි. වැගිරීම යනු ස්නානය නොවෙයි. දේව රාජ්‍යය සහ ක්‍රිස්තුස් වහන්සේ දැනගැනීම සහ උන්වහන්සේ සමඟ තැන්පත් කර නැවත උත්ථාන වීමේ ජායාවේ ජීවත් වීමයි. තර්ක කිරීම, අත හැර දේව වචනය වෙතට හැරෙන්න. ඔබගේ ඇදහිල්ලත්, ඔබගේ සහාවත්, දේව වචනය මත ගොඩනගන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍ය ළංව තිබේ. මූරණ්ඩුකමෙන් බිහි වූ බිහි වූනා වූ ඉගැන්වීම් නැති වී යන දවස් ළඟය.

45. අලුත් ගිවිසුමේ පසුතැවිල්ලේ බව්තිස්ම යනු ඇයි ගිල්වීම යනුවෙන් පරිවර්තනය නොකළේය. ගිල්වීම යනු වතුරෙන් ගිල්වීයි.

## බව්තිස්ම දිය යුත්තේ කාටද?

46. අදහන්නා වූ බව්තිස්මය ලබන්නා වූ තැනැත්තා ගැළවනු ලබන්නේය. නමුත් අදහා නොගන්නා තැනැත්තා වරදට පත් කරනු ලබන්නේය. (මාර්ක් 16:16) එසේ නම් අදහාගන්නට බව්තිස්ම කළ යුතු නොවේද?. නොඅදහගන්නාට බව්තිස්ම කළොත් කුමක්ද?. බව්තිස්ම කළොත් වරදට පත් කරලා හමාරය.

47. අම්මා කියා, කියාගන්නවත් බැරි කුඩා දරුවන්ට ඉසීමේ බව්තිස්මය දෙන්නා වූ මොවුන් කව්ද?. ඔවුන් උගතුන් හා නුවණ ඇත්තන්ය. උපාධි ලබාපු අය වෙති. මොවුන් කොහෙන්ද මේ බව්තිස්ම ලබා ගත්තේ? ක්‍රි. පූ. 325 වෙනි වර්ෂයේදී කතෝලික සභාවේ මුහුන් එළිදරව් විය. මෙයට ශු. බයිබලය සඳහන් නොවුන දේවල්ය. මේ දේවල් මූරණ්ඩුකම්වලින්ද සහ තර්කවලින් පවතිනවා. නමුත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැවසුවේ. අදහා ගන්නා බව්තිස්ම ලබා ගන්නා ගලවනු ලබන්නේය යනුයි. යේසුස් වහන්සේ උගන්වපු දේ විශ්වාස කරනවාද එසේ නොවෙයි නම් මේ උගතුන් සහ නුවණ ඇත්තන්ගේ ඉගැන්වීම්වලට ඇහුම්කන් දෙනවාද?. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉක්මණින් එන සේක. කුඩා ළමුන්ව මා වෙතට එන්න ඉඩ අරින්න. කියමින් යේසුස් වහන්සේ ඔවුන්ට

ආශිර්වාද කලා මිස ඔවුන්ට බවුතිස්ම ලබා දෙන ලෙස නොකීවේය. (මතෙව් 19:13-15) අදහන්නට බව්තිස්ම ලබා දෙන ලෙස උගන්වපු යේසුස් වහන්සේ පිලිප්දේශයේ හිරගේ මුලාදැනියාගේ නිවසේ සිටියා වූ කුඩා ළමුන්ට බව්තිස්ම ලබා දෙන ලෙස පාවුල් තුමාට උන්වහන්සේ අණ කළ බවට බයිබලයේ සඳහන් වී තිබෙනවා ද? නැත මූලාදැනියාගේ නිවසේ කුඩා ළමුන් සිටිය හැකියය ඔවුන් තර්ක කර සිටිනවා. එවැනි දේවල් උගතුන් හා නුවණ ඇත්තන් ගේ අනුමානයයි. නමුත් එය බයිබලයේ සඳහන් වී නොමැත. (ක්‍රියා 16:22 - 34) ළමුන්ට බව්තිස්ම ලබා දුන්නා වූ ගෝලයන්ද බව්තිස්මය ලබා ගත් දරුවන් ද බයිබලයේ නොමැත. කුඩා ළමුන්ට ලබා දෙන බව්තිස්ම කොටස සභාවල්වලින් ඉවත් කරන්න. දේව වචනය මත ගොඩනගන්න! යමෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ට ඇතුල් වන්න නම් වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ඉපදෙන්නට අවශ්‍ය බවට උගන්වපු ස්වාමීන් වහන්සේ තමන් වහන්සේ ද බව්තිස්ම ලබා ගන්නා පිණිස ජෝර්දාන් ගඟට ගිය සේක. උන්වහන්සේ බව්තිස්මේ වැදගත් කම් දැන උන්වහන්සේම ආදර්ශය වූ සේක . දොරකඩින් ඇතුල් නොවෙනවා නම් සොරෙක්ද, කොල්ල කන්නෙක්ද වේ. දොර කඩින් ඇතුල් වන්නා වැටළු එඬේරාය.(යොහන් 10:1-2) වතුර වලක් වන්න බැ. වතුර තහනම් කරන්න කාට පුළුවන්ද (ක්‍රිය 10:17)

## බව්තිස්ම ලබා ගැනීම වලක්වා හැරිය හැකිද?.

48. බව්තිස්ම දෙන්න යයි යේසුස්වහන්සේ කී සේක. (මතෙව් 28 : 19)
බව්තිස්ම ලබා ගන්න කියා පේත්‍රුස් කියා සිටියේය. (ක්‍රියා 2 : 38)
බව්තිස්ම අවශ්‍ය යයි කියමින් උගන්වයි. ගැලවීමේ හමුදාවේ උගතුන් හා නුවණ ඇත්තන් ඔබ කාටද කියන්න යන්නේ. ක්‍රිස්තුස්වහන්සේ ට සහ උන්වහන්සේගේ ගෝලයන්ටද එසේ නොවෙයි නම් හමුදාවේ නිලධාරින්ට ද?. මනුෂ්‍යයන්ට වඩා දෙවියන් වහන්සේට අපි කීකරු විය යුතුයි. (ක්‍රියා 10 : 47) ඔබ කුමක් කරන්න යනවාද?.

49. ගිල්වීමේ බව්තිස්මය පිළිගත හැකි ද?.
බව්තිස්මය කුමන ආකාරයෙන් ලබා දෙන්නේද ? සහෝදර සභාවේ, ලබා දෙන්නා වූ ගිල්වීමේ බව්තිස්මය ද? එසේ නොවේ නම් බැප්ටිස්ම් සභාවේ ලබා දෙන්නා වූ ගිල්වීමේ වූ බව්තිස්මය ද? නොවෙයි නම් ඉන්දියානු පෙන්තකොස්ත සභාවේ දෙන්නා වූ බව්තිස්මය ද සහෝදරවරුනි, එක් වරක් ගිල්වීම ද? දෙවරක් හෝ තුන්වරක් ගිල්වීමද? සිටින අතට ද අතින් අතටද?.



67. ලංකා පෙන්තකොස්ත සභාව මගින් නිකුත් කරන ලදුදා වූ පත්‍රිකාවෙන් ප්‍රෙත්‍රුස් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයත් බව්තිස්ම ලබා ගන්න යයි කියූ අවස්ථාවේ ඔහු සිතේ තිබුනේ කුමක්දැයි? කියා ප්‍රකාශ කරමින් යේසුස් ක්‍රිස්තුස් වහන්තේගේ නාමයෙන් පැකිලී වැටෙනවා. පේත්‍රුස්ගේ මුඛය තුලින් කථා කලේ ශු.ආත්මයාණන් වහන්සේ ය. මුඛයේ එක් දෙයක් සිතේ තව දෙයක් තබාගෙන කථා කරනට උන්වහන්සේ මනුෂ්‍යයෙක් නොවෙයි. සිතේ තිබුනා වූ දේමයි උන්වහන්සේ මුඛයෙනුත් කථා කලේය.

68. මනුෂ්‍යයා මොන තරම් සුදු වස්ත්‍ර ඇන්දාට, තමන්ගේ නිවස, වස්තු සියල්ල අත්හැරලා ඇවිත් හාලෙලූයා කියමින් අන් භාෂා කථා කලාටත් වචනය නොදැන වචනය විරුද්ධ වීම ශු. ආත්මයාණන් වහන්සේගෙන් නොවෙයි.

69. රෝමානු කතෝලික සභාවට අයත් අය පවසන්නේ අපේ සභාවේ පළමුවෙන් පාප් වහන්සේ පෙත්‍රුස් යයි කියමින් මෙය සම්පූර්ණයෙන්ම අසත්‍යයයි. ඔවුන් පවසන්නේ සත්‍යය නම් අද දවසේ දින් පේත්‍රුස් ලබා දුන්නා වූ බව්තිස්මය ලබා දිය යුතුයි.

70. පේත්‍රුස්, ස්වාමීන් වහන්සේ විසින් එවනු ලැබූ සුභාරංචිය කොර්නේලියස් සහ ඔවුගේ මිත්‍රයන්ටත් අනිකුත් අයට ප්‍රකාශ කලා. ඔවුන්ද අන්‍ය ජාතින්ව සිටියා ඔවුන් පිටට ශු. ආත්මයාණන් බහිනවා දුටු පේත්‍රුස් ස්වාමියාවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම කරන පිණිස අණ කළහ.

## පිලිප් - දෙවන සාක්ෂිය

71. පිලිප්, ස්වාමීන් වහන්සේ විසින් සේවයට කැඳවූ කෙනෙක් ය. ඔහු ගෝලයෙක් (යොහන් 1:43) අනිකුත් ගෝලයන් මෙන් ඔහුද පෙන්තකොස්ත දවසේ දී ශු.ආත්මයාණන්ව ලැබුවේය. (ක්‍රියා 1:13) ශු. ආත්මයාණන් විසින් තෝරාගත් හත්දෙනාගෙන් මොහුත් කෙනෙකි. මොහු ශු. ආත්මයාණන් සහ ප්‍රඥා හා යහපත් සාක්ෂි ලබාපු කෙනෙක්ය. (ක්‍රියා 6:3 - 6) ඔහු සභාරංචි සේවයේ යෙදෙමින් සිටියාය. (ක්‍රියා 21:8) එතියෝපියානෝ නපුංසකයාට බව්තිස්මය ලබා දෙන පිණිස මොහුට ශු. ආත්මයාණන් වහන්සේ කථා කල සේක. මෙයින් පිලිප්ගේ සාක්ෂිය පිළි අරන් පසුතැවිලි වෙනවාද නොහොත් උගතුන් හා නුවණ ඇත්තවුන් අනුව ගොස් රාජ්‍යයෙන් පිට සිටිනවාද ?

72. පිලිප් සමාරියා දේශයේ දේශනා කරමින් හාස්කම් වලිනුත් ලකුණු වලිනුත් වචනය ස්ථිර කළහ. (ක්‍රියා 8:5 - 8) අදහාගත් අයට ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයත් බව්තිස්ම කලා (ක්‍රියා 8:14 - 17) ඔබ ලබා දෙන්නා වූ බව්තිස්මය වැරදි ලෙස පරිවර්ථනය කරන්නේ ඇයි.

62. දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් සාක්සිවලින් සැබෑ වූ එළිදරව්වක සඳහන් වී ඇත. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයත් බව්තිජ්ම කලා වූ සාක්ෂි තුනක් ඉදිරිපත් කරයි. අද දවසේ දී උපාධි ලබාපු උගතුන් හා නුවණ ඇත්තන් ලබා දෙන්නා වූ බව්තිස්මයට සාක්ෂි තබෙනවා නම් ඉදිරිපත් කරන්න.යේසුස් ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධ වීම ගලකට පයින් ගැසීමට සමානය. එම ගල පිළිබඳව යේසුස්වහන්සේ පවසන දේට ඇහුම්කන් දෙන්න. මෙම ගල පිට වැටෙන්නා පොඩි වී යන්නේය. නමුත් ඒක යමෙකු පිට වැටුනොත් ඒක ඔහු ධූලි මෙන් සුනු කර දමන්නේයයි කී සේක. (මතෙව් 21:44)

63. යේසුස්වහන්සේ ස්වර්ග රාජයෙහි යතුර (වතුරෙන් හා ආත්මයාණන්ගේ ඉපදීම) වූ ස්වර්ග රාජ්‍යට ඇතුල්වීමට තිබෙන්නා වූ පේත්‍රුස් වෙත දෙමින් වැඩීමහල් ස්වර්ගයේ යතුර නුඹට දෙන්නෙමි. නුඹ පොළවෙහි යමක් බඳිනවාද? ඒ ස්වර්ගයේදි ද බඳිනු ලබන්නේය. නමුත් නුඹ පොළවෙහි යමක් මුදන්නෙහි ද එක ස්වර්ගයේ දි ද මුදනු ලබන්නේය. (මතෙව් 16:19)

64. පෙත්‍රුස් පෙන්තකොස්ත කියන්නා වූ අවසේ ලැබුවා වූ ශු. ආත්මයාණන් වහන්සේගේ බලයෙන් සහ එළිදරව් වූ නාමයෙන් දේශනා කරමින් 3000 කට බව්තිස්ම ලබා දුන්නේය.

65. නුඹලා පසු තැවිලි වී පව් කමාව පිණිස (පසු තැවිලි සහ පව් කමාව කොයි නාමයෙන් ද දේශනා කළේ. ඔබ තේරුම් ගන්න.) යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන්ද බව්තිස්ම ලබා ගන්න. එවිට ශු. ආත්ම දීමනා ලබන්නාහුය. පොරොන්දුව ඔබටත්, ඔබගේ දරුවන් සහ අපේ ස්වාමින් වහන්සේ කැඳවන්නා වූ සියළු ජාතීන්ටත්ය. එසේ නම් අවුරුදු 2000 ඇත සිටියා වූ අපටත් අයිති බව කියමින් තවත් බොහෝ දේවල් උගන්වමින් (යේසුස් වහන්සේගේ නාමයෙන් ඔබ දෙන්නා වූ බව්තිස්මය වැරදි කියලා කියන්නා වූ අද කාලේ උගතුන් හා නුවණ ඇත්තන්ගෙන් ඈත් වී ඔබව ගලවා ගන්න.) මෙම දැනමුතුකම්වලට ඇහුම් කන් දෙන්නේ කව්ද?. ඔහුගේ වචන සන්තෝෂයෙන් පිළිගත් අය (තර්ක කලා වූ අය නොව සන්තෝෂයෙන් පිළිග් අය) බව්තිස්ම ලබා ගත්තේය. ඒ දවසේ 3000 ක් එකතු කරන ලද්දේය (ක්‍රියා. 2:38-41)

66. පේත්‍රුස් වතුරෙන් දෙන්නා වූ බව්තිස්මය. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ බඳිනු ලැබුවේය. මෙයද ස්වර්ගයේදි මේ ආකාරයෙන්ම බඳිනු ලබන්නේය. එදා දවසේ පේත්‍රුස් වෙත තිබුනා වූ ශු. ආත්ම අද දවසේ යම් දේව දාසයෙක් මත සිටිනවා නම් ඔහු ද එදා පේත්‍රුස් 3000 ට බව්තිස්ම කලා වූ එම නාමයන්ම අද දවසේ දීත් බව්තිස්ම ලබා දෙන්නේය.



50. ගිල්වීමේ බව්තිස්ම කරන්නා වූ සියළු දාසයන් කියා සිටින්නේ තමන් ශුද්ධ ආත්මයාණන්ව ලබාපු බවයි. නැවත ඉපදුනු බවයි. මේ ආකාරයෙන් සියළුම සභාවල් එක් ආත්මයක් උපත ලැබුවා නම් එකාකාරයෙන් ගිල්වීමේ බව්තීස්ම කරාවි, මන්ද ශු. ආත්මයාණනන් සියළුදෙනාට එකම ආකාරයෙන් මග පෙන්වනවා නොවේද? (යොහන් 3 : 16) මන්ද යේසුස් වහන්සේ පැවසූ සියළු දේ ශු. ආත්මයාණන් වහන්සේ මතක් කරන සේක (යොහන් 14: 26)

51. වතුර බව්තිස්මය එය දේව රාජ්‍ය විවෘත කරන්නා වූ යතුරක්ය. මෙය මනුෂ්‍යයාගේ නිර්මාණයක් නොවෙයි. මෙය යේසුස් වහන්සේ පෙත්‍රුස් වෙත භාර දුන්නා වූ යතුර (මතෙව් 16 : 15 - 20) යේසුස් වහන්සේගේ වචනය මත මනුෂ්‍යයගේ වචනය එකතු කිරීම හේතුවෙන් මේ තරම් නොයෙක් ආකාර බව්තිස්ම බිහිවෙලා තිබෙන්නේ. එවැනි බව්තිස්ම කරන්නා වූ අයගේ තර්කවල අවසානයක් නොමැත.

52. නෝවාගේ නැවේ හිටියා වූ 8 දෙනා ජල ගැල්මේ බව්තිස්ම ලැබූ බවයි. (ප්‍රෙතැස් 3:20 - 21) නෝවාගේ දවස්වල දවස් 40 වර්ෂාව තිබුණු බැවින් අපිද 40 වතාවක් බව්තිස්මය ලැබිය යුතුයි යන තර්කය යි.

කුෂ්ඨ රෝගියෙක් වූ නාමන් (රාජාවලිය 5:14) 7 වරක් ගඟේ ගිල්වූයේය. එම නිසා අපි 7 වරක් ගිල්ලවා බව්තිස්ම කළ යුතු බවට තර්ක සහ යේසුස්වහන්සේ තමන්ගෙ ගෝලයින්ට (මතෙව් 28 : 19) පැවසූ දේ - එසේ නම් පියාණන් වහන්සේගේ නාමයෙන් එක් වරක් ගිල්වීම ද පුත්‍රයාණන් වහන්සේගේ නාමයෙන් එක් වරක් හා ශු. ආත්මයාණන් වහන්සේගේ නාමයෙන් එක් වරක් කියමින් 3 වරක් බව්තිස්ම කළ යුතුය යයි කියා තර්ක කරයි.

53. වතුරෙන් ඉපදීම යනු එක් ඉපදීමක් ය, එසේ නම් තුන් වතාවක් ගිල්වීම යනු තුන් ඉපදීම නොවෙයිද?. ක්‍රිස්තුස් වහන්සේ එක් වරක් මැරිලා, මළවුන්ගේ නැගිට්ටා. අපිත් බව්තිස්ම තුළින් උන් වහන්සේ සමඟ තැන්පත් කරනු ලබන්නෙමු. උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ට ආකාරයෙන් අපි නැගිටවනු ලබමුව. එම විශ්වාසය මතයි දියෙන් ගොඩට එමුව (රෝම 6 : 3 - 8) පියාණන් වහන්සේ සහ ශු ආත්මයාණන් වහන්සේ මැරුනේ නැහැ. එසේ වුනා නම් ඒ ඔවුන් වෙනුවෙන් එසේ කලාට කමක් නෑ. නමුත් එය එසේ සිදු වූනේ නෑ. පියාණන්වහන්සේ අප උදෙසා තමන් වහන්සේගේ පුත්‍රයාණන්ව දුන් සේක. මෙයයි සැබෑව. සුශාරංචිය ජේසුස් වහන්සේ සභාවේ පාරම්පරික බැඳුම් වලින් නිදහස් කරන සේක. අදහන්නට මිදීම දෙන සේක, සභාවේ දාසයෙකි ඔබේ

සභාව දේව වචනයට හරවන්න. එසේ කරනවා නම් ස්වර්ගයේදී ඔබගේ එල බොහෝය.

54. ගිල්වන්න ඔනේ මුලින් අතට ද? එසේ නොවේ නම් පැත්තකට ද?, ගිල්වීමේදී අපි යේසුස් වහන්සේ සමග තැන්පත් කරනු ලබමුව. මළවුන්ව තැන්පත් කිරීමේදී කොයි අතටද වල දමන්නේ, ස්වභාවයෙන්ම අපි තේරුම් ගන්නවා නොවෙයිද. නමුත් ඇසුවොත් කියන්නේ ස්නානයේදී උඩ බලන්නේ නැහැයි කියමින් විහිළු කරමින්ය. බව්තිස්මයේදී තැන්පත් කරන බව උගතුන්ට හා නුවණ ඇත්තන්ට නොහැගි ගියේ මන්ද?.

55. මේ දක්වා අපි කියපු දේ ටිකක් මතක් කර ගනිමු. කුඩා දරුවන්ට බව්තිස්ම කිරීම, බව්තිස්මේදී ඉස මත වතුර ඉසීම, එසේ නොවෙයි නම් ඉස මත වතුර බාල්දියක් වැක්කිරීම, තුන් වතාවක්ම ගිල්වලා ලබා දෙන්නා වූ බව්තිස්මයත්, රෝමාණු කතෝලික සහ පෙන්තකොස්ත සභාවල්වලින් කරන්නා වූ මුහුන් හා වැරදි බව වටහා ගනිමු. මුහුන්ගෙන් ප්‍රවේශම් වන්න කියා යේසුස් වහන්සේ උගන්වපු දේ මතක තිබෙනවා ද?. (මතෙ. 16:6 - 11, 12) අවදියෙන් සිටින්න. පසු තැවිලි වන්න. දේව රාජ්‍ය ළංව තිබේ.

56. එසේ නම් කා හට ද බව්තිස්ම දිය යුත්තේ ?. පසුතැවිලි වී දේව රාජ්‍ය ශුභාරංචිය විශ්වාස කරන අයට පමණක් කොයි ආකාර බව්තිස්ම ද දිය යුත්තේ. සම්පූර්ණ ගිල්වීමේ බව්තිස්ම කළ යුතුයි. කොයි ආකාරයට ද ගිල්වන්නේ. ? යම් මනුෂ්‍යයෙක්ව   භූමදාන කරන ආකාරයට දිය යුතුයි.

## මොන නාමයෙන් බව්තිස්ම කල යුතුද?

57. ඥානවන්තයා ඔබගේ නාමය දකිනවා ඇත. (මීකා. 6: 9)
අද දවසේ රෝමානු කතෝලික සභාව පටන් පෙන්තකොස්ත සභාව දක්වා නුඹට පියාණන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේගේ ශු. ආත්මයාණන් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම දෙනවා කියමින් බව්තිස්ම ලබා දෙමින් සිටිනවා.

58. නමුත් මෙවැනි බව්තිස්ම ලබා දුන්නා වූ ගෝලයන් හෝ එවැනි බව්තිස්ම ලබා ගත්තා වූ ඇදහිලිවන්තයන් අපි කියවන්නා වූ බයිබලයේ නොමැත. එසේ තිබෙනවානම් දේව වචනය ගෙන මා හට ලියා දන්වන්න. එසේ නොමැති නම් සැබෑව පිළිගන්න. පසුතැවිලි වීම සහ පව් කමාව, යෙරුසලමේ පටන් සියළුම ජාතීන්ට ප්‍රකාශ කිරීමට එක නාමයක් තිබෙනවා. නමුත් අද කාලයේ සභාවල්වල ලබා දෙන්නා වූ බව්තිස්මවලින් ඒ නාමය නැත. ඒ නාමය කුමක්ද?.



එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන් සිත් පහදවා ඔවුන්ට කියන සේක. මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වධ විඳින්නටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්නටත් යෙරුසලම් පටන් සියලූ ජාතීන්ට පසුතැවිල්ල හා පව් කමාව උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නටත් යුතු යයි ලියා තිබේ. නුඹලා මේ දේවල්වලට සාක්ෂිකාරයෝය. මගේ පියාණන්ගේ පොරොන්දුව මෙසේ බලව. මම මගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලා යැයි කී සේක. (ලූක් 24:45 - 49)

59. මෙම වචනවලින් කරුණු හතරක් අපි දකිනවා. (1) ඔවුන්ගේ සිත් උන්වහන්සේ පහදව්වා. (2) එවිට ඔවුන් පසුතැවිලි වීම සහ පව් කමාවට ජෙරුසලමේ පටන් සියළු ජාතීන්ට දේශනා කිරීමට ලබා දුන්නා වූ නාමය ඔවුන් විසින් හඳාගත්තා (3) එම එළිදරව්වලට සාක්ෂිකාරයෝ වූ සේක. (4) ශු. ආත්මයාණන් වහන්සේව ලබා ගන්න පිණිස ඔවුන් ජෙරුසලමේ රැඳී සිටියෝය.

60. එවිට පෙන්තකොස්ත කියන්නා වූ මංගල්‍ය දවසේදී ඔවුන් පිටට ශුද්ධ ආත්මයාණන් වහන්සේ බැස්සේය. ඔවුන් ඉහළින් ලැබෙන්නා වූ බලයෙන් සරසනු ලැබුවේය. එවිට ඔවුන් සාක්ෂිකාරයෝ වූ සේක. එළිදරව් වූනා වූ ඒ නාමය උදෙසා ඔවුන් හිරගෙදරවල්වල තබනු ලැබුවේය. පහරදෙනු ලැබුවේය. නින්දා කරනු ලැබුවේය. සාක්ෂිකාරයෝ වූ සේක. මෙවැනි දේවල් අද දක්වා අපි බයිබලයට ක්‍රියා පොතේ කියවමින් සිටිනවා.

61. පසුතැවිල්ල හා පව් කමාව පිනිස ලැබුණා වූ නාමය කුමක්ද ?. සැබවින්ම එකම බව්තිස්මය කුමක්ද?. ඒ නාමයනම් ස්වාමියාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයයි. අපෝස්තලවරුන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් ලබා දුන්නා වූ බව්තිස්මය සැබෑවූ බව්තිස්මය, මෙයද උගතුන් හා නුවණ ඇත්තන් නොපිළිගත්තා වූ නාමය. ළදරු සිත් ඇත්තා වූ අයට එළිදරව් වූනා වූ නාමය. මෙම නාමයෙන් බව්තිස්ම කළා වූ බව්තිස්ම ලැබූවා වූ අයව බයිබලයේ ක්‍රියා පොතේ සහ පාවුල් තුමාගේ ලිපි වලින් දැක ගත හැකිය.  නමුත් පියාණන් හා පුත්‍රයාණන් වහන්සේගේ ශු. ආතමයාණන්ගේ නාමයන් බව්තිස්ම ලබා දෙන්නෙමුව කියා බව්තිස්ම ලබා දිපු අය සහ ලබා ගත්තා වූ අය බයිබලයේ කොහේවත් නැත. එක සාක්ෂියක් වත් නැත.